# පුංචි අපිට තේරවිලි




නදෙව්නි ටමාෂා විජේසුන්දර

# පුංචි අපිට තේරවිලි

නදෙව්නි ටමාෂා විජේසුන්දර

**ISBN - 978-624-208-075-8**

කෘතිය පළ කරන දිනය - **15.11.2023**

කතෘගේ වෙනත් කෘති - අපූරු තැග්ග රජතුමාගේ උපාය

**Guzz** පූසාගේ අපූරු චාරිකාව

පූසාගේ බඩරිදිල්ල

එලීනා සහ රියානා

**Liza's Dream**

# පිදුම

මෙම කෘතිය ලිවීමට මට උදව් උපකාර කළ

මගේ ආදරණීය

අප්පච්චීට, අම්මාට, ලොකුඅම්මාට,

අත්තාට, අත්තම්මාට සහ

චූටි නංගීටත්,

නිරතුරුවම මා දිරිමත් කරමින් යහමඟ පෙන්වන

ආදරණීය සමන්මලී ගුරුතුමියටත්

ඉතා සෙනෙහසින් හා ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවත් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11. 01

# පුංචි අපිට තේරවිලි



1) පීනන්න බැරි මාළු - ආන මාළු

2) ගෙදර ලිය - ඇතිලිය

3) වංගෙඩි හතරකින් කන්දක් උස්සනවා - අලියා

4) බිත්තියේ ඉන්නවා ටික් ටික් ගානවා - ඔරලෝසුව

5) මේ පැංචා වඩුරාළට උදව් වේ - අතකොලුව

6) කොළ පාට බංගලාවක සුදු පාට මෙට්ට දාගෙන, කළු මිනිස්සු බුදි - අනෝදා ඇට

7) ඉස්පිලි, පාපිලි, ඇලපිලි, යංසය, හල්කිරීම, කොම්බු නොයෙදෙන සිංහල අකුර - ඉ

8) ශරීරයේ අවයව තුනක් එක්වීමෙන් නම් කෙරෙන උපකරණයකි - ඇස් කන් නාඩි

9) ගහක් උඩ ගෙඩියක්,
ගෙඩියක් උඩ ගහක් - අන්නාසි



10) පෙනෙන තැන සිට ඇසෙන තැනට කොපමණ දුරද? - ඇසේ සිට කනට ඇති දුර

11) ලෝකයම වහනවා - ඇස් දෙක

12) තුන් ඉරි අප්පු - ලේනා

13) හොටු බේරෙන සුදු මහත්තයා - ඉටිපන්දම

14) ඇවිදින කූරු මිටිය - ඉත්තෑවා

15) ලේන්සුවක් ගෙනාවා වතුරට දැම්මා පෙහෙන්නේ නෑ - හබරල කොළය

16) නගිනකොට එළියයි, බහිනකොට කරුවලයි - ඉර

17) නොදිරන කොට දෙක - යනකොට හා එනකොට

18) මහත්තය රතුයි තොප්පිය කළුයි - ඔළිඳ ඇටය





19) වාඩි වූ විට ඇත, නැගිට්ට විට නැත - ඔඩොක්කුව

20) අලියා නොයන මග - ඉනිමඟ

21) තමන්ට වාඩිවිය නොහැකි අනුන්ට වාඩිවිය හැකි තැන - උකුල

22) තුන් දෙනෙක් යනවා දොළොස් දෙනෙක් බලා ඉන්නවා - ඔරලෝසුව

23) රැට ලෑල්ල උදේට බම්බුව - පැදුර

24) දිනන්නෝ පස්සට යති - කඹ ඇදීම

25) පාරේ රැළ - කඩිරැළ

26) ගින්නක් නැති දුම - මීදුම

27) නාන්න බැරි විල - කරවිල

28) අපිරිසිදු වූ විට සුදු පාටය - කළු ලෑල්ල

29) නැට්ට නැති කොළේ - කඩදාසිය

30) හැන්ද නටයි - කූර නටයි - රතු ළමයා - තෙලේ නටයි - කැවුම්

31) උදේට හිස් වට්ටිය රෑට මල් වට්ටිය - තරු පිරි අහස

32) මව් මරා උපන් කුමරා - කෙසෙල් කැන

33) ලොකුම ගින්න - කුසගින්න

34) ගහක් උඩින් මුවෙක් පැන්නා - කෙසෙල් මුව

35) ඔක්කොගෙම මල්ලි - කොත්තමල්ලි

36) අපේ වත්තේ ගිනි කිකිළි - කොච්චි කරල

37) කොච්චර ගියත් අඩි හිටින්නේ නෑ - ගඟ

38) අලියා නොකන දැල්ල - ගිනි දැල්ල

39) සෝදන්න සෝදන්න අපිරිසිදු වෙනවා - ජලය

40) ඉංග්‍රීසියෙන් , දෙමළෙන් සහ සිංහලෙන් නම් කරන එළවළුවකි. - ගෝ-වා-ගෙඩිය

41) කටු නැති ගහ - මොල් ගහ

42) පුංචි ගෙදර දර පුරවලා - ගිනි පෙට්ටිය



43) ගසේ නම නොකියන අත්තේ නම - ගොක් අත්ත

44) අලියට උගුලන්න බැරි ගහ - තුත්තිරි ගහ

45) බිමදි දුඹුරුයි - අහසෙදි සුදුයි - කෝටු වගේ පාද දෙකයි - කොකා

46) ගසේ නම නොකියන මලේ නම - පනාමල

47) අක්කට නෑ, නංගිට එකයි, නයනට දෙකයි, සමනලයට මැදින් එකයි - 'න' යන්න

48) අලියා නොයන ගම - පෙට්ටගම

49) කළු අම්මට සුදු පුත්තු ගොඩයි - බත් මුට්ටිය

50) කැවොත් පළතුරකි, වැළඳුණොත් රෝගයකි - පැපොල්

51) නැට්ට නැති ගෙඩිය - බිත්තරය



52) පුංචි ළිඳේ වතුර රසයි, ළිඳ තියෙන්නේ ගහක් උඩයි - කුරුම්බා ගෙඩිය

53) මල්ලේ දාගෙන යන්න පුළුවන් රට - බුරුමය

54) කැවොත් පළතුරක්, කැපුවොත් අනතුරක් - බෙලි

55) කැලේ ලේ බිංදුව - මදටිය ඇටය

56) විදින්න බැරි දුන්න - දේදුන්න

57) ගෙදර ඇතුලේ තිබෙන ගහ - මෝල් ගහ

58) කන්දක් කපාගෙන සුද්දෙක් බසී - රබර් කිරි

59) හැමෝටම තියෙන දෙය - නම



60) හැම ගෙදරකම ඉන්න මුරකාරයා - යතුර

61) උඩින් ගල් වැටියයි - යටින් ගල් වැටියයි - මැදින් නයි පැටියයි - දිව

62) ටක් ගානව ටික් ගානවා - ටිකක් කනවා දොර වහනවා - හුණු කිල්ලෝටය

63) කුස්සියේ තිබෙන ගෙඩිය - වංගෙඩිය

64) පිරිසිදු කළාම කලු පාටයි - කළුලැල්ල

65) හෝදනවා හෝදනවා සුදුවෙන් නෑ - වතුර

66) ලොකුම දානය - සමාදානය

67) නැතුවම බැරි ලී - සල්ලී

68) එපා වෙනකොට ළඟට ගන්නේ ඕන වෙනකොට විසිකරන්නේ - නැංගුරම

69) සුදු ඇඟිල්ල - හුණු කූර

70) අන්ධයට පෙනෙන්නේ මොනවද? - හීන

71) ඔබේ සාක්කුවේ නොතිබිය යුතු දෙයකි - හිලක්

72) අත්තෙන් අත්තට පනින කුරුල්ලා බිමට වැටුණු විට වෝර කුරුල්ලා - වැහි බිඳුව

73) නූල් බැඳි අහස් යානාව - සරුංගලය

74) කොච්චර දිව්වත් අල්ලන බැරි - සෙවනැල්ල



75) අඟුරු කකා වතුර බිබී කොළඹ දුවන යකඩ යකා - කෝච්චිය

76) කාගෙත් අයියා - දහයියා

77) බෙල්ලෙන් අල්ලා මුල්ලෙන් තිබ්බා - හිරමනය



78) උස ගසකි, ලෙඩකි, නමට අකුරු දෙකකි - උණ

79) කිසිම කෙනෙක් නොයා යුතු මග - නොමග

80) කාන්තාරයේ නැව - ඔටුවා

81) කිසිවෙකු නොකියවන පොත - ඉලපොත

82) වඩු බාස් ළඟ තියෙන රට - බුරුමය

83) කටු නැති කැලේ ඇට නැති සතා - උකුණා

84) අත්තක් උඩ බුම්මාගෙන කටු රෙද්දක් පොරවාගෙන - කොස් ගෙඩිය

85) ඇඟේ වදිනවා ඒත් අල්ලන්න බෑ - සුළඟ

86) අතු අග පිපෙන ලිය - අරලිය

87) ගියොත් ආයේ නොඑන දේ - වයස

88) මුළුතැන් ගෙයි ඇති ආහාරයට ගන්න ඉලක්කම් දෙක - තුනපහ

89) වත්ත පහල ඩිගිස් ඩිගිස් ගෙට ඇවිදන් බරස් බරස් - පොල්

90) කන්න බැරි පැණි - කොම්පැණි

91) කන්න දෙනකොට ජීවත් වෙනවා, වතුර දෙනකොට මැරෙනවා - ගින්දර

92) පියාසලයි, ඉහල නොයයි, හිත රිදුනොත් මෙයා අඩයි - ඇස

93) පාවඩ පිට මම යන්නේ ඒ වුණාට බඩගින්නේ - ඉස්ත්‍රික්කය

94) ඇඳුම් සියයක් ගැලෙව්වත් බොත්තම් නෑ - ගෝවා ගෙඩිය

95) කලු තොප්පියක් දාගත් සුදු

මහත්තයා - ගිණිකූර

96) කකුල් හතරක් ඇත, එහෙත්

ගමනක් නැත - පුටුව

97) ණය දෙන්නේ නැති බැංකුව - ලේ බැංකුව

98) තනි කකුලෙන් ඉන්න සුද්දා - හතු

99) පිපෙන්නේ නැති මල - කම්මල

100) දවල් කනා - බකමූණා



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මන් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023.11.01**